අධිකරණ අමාත්‍යාංශයීය චක්‍රලේඛ :10/2022

මාගේ අංක MOJ/E4/PS/EB/2023
අධිකරණ,බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ
අමාත්‍යාංශය,කොළඹ 10.

2022 දෙසැම්බර් මස 19.....වන දින

සියලුම මහාධිකරණ විනිසුරුවරුන්/වරියන්,
සියලුම සිවිල් අභියාචනා මහාධිකරණ විනිසුරුවරුන්/වරියන්,
සියලුම ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරුවරුන්/වරියන්
සියලුම දිසා විනිසුරුවරුන්/වරියන්,
සියලුම දිසා මහේස්ත්‍රාත්වරුන්/වරියන්,
සියලුම මහේස්ත්‍රාත්වරුන්/වරියන්,

<u>සිතාසි බෙදන්නා හා ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා සහ අධිකරණ සෝෂක හා ප්‍රවේශක තනතුරු සඳහා 111 වන කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් යොමු අංක PSC/EST/06-01-32/01/2016 හා 2016.07.26 දිනැතිව අනුමත කරන ලද සිතාසි බෙදන්නා හා ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා සහ අධිකරණ සෝෂක හා ප්‍රවේශක තනතුරු සඳහා වන බඳවා ගැනීම් පටිපාටියේ 8.1 වගන්තිය අනුව ඉහත තනතුරේ 111 වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ගතවීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉමද,11 වන ශ්‍රේණියට උසස් වී වසර 03ක් ගත වීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉමද,1 ශ්‍රේණියට උසස් වී වසර 05ක් ගතවීමට පෙර 3 වන කාර්යක්ෂමතා කඩඉමද සම්පූර්ණ කළ යුතුය.

02. ලිඛිත පරීක්ෂණ ලෙසට පැවැත්වෙන 1 හා 11 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ අධිකරණ අමාත්‍යාංශය මඟින් පවත්වන අතර 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වාචික පරීක්ෂණයක් බැවින් එය අදාළ අධිකරණය මඟින් පැවැත්වීම වඩාත් ප්‍රායෝගික බැවින් උක්ත තනතුරු වලට අදාල 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය අධිකරණයන් මඟින් පැවැත්වීමට කටයුතු කල යුතුවේ.

04. අධිකරණ ආරක්ෂක/පිස්කල් පියන්/පිස්කල් භාරකාර මාතා තනතුරු සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම සම්බන්ධයෙන් 2016.08.25 දිනැති අංක 06/2016 දරණ හා 2016.12.30 දිනැති අංක 10/2016 දරණ අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛයන්හි දක්වා ඇති විධිවිධාන පරිදිම කටයුතු කල යුතු වේ.

05. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව විය යුතු වන අතර,බඳවා ගැනීම් පටිපාටිය අධිකරණ අමාත්‍යාංශය වෙබ් අඩවියේ (www.moj.gov.lk) පළ කර ඇත.

06. මෙම චක්‍රලේඛ විධිවිධාන 2022.12.20 දින සිට ක්‍රියාත්මකවේ.

ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

පිටපත්-01. ලේකම්,අධිකරණ සේවා කොමිෂන් සභාව
02. ප්‍රධාන අභ්‍යන්තර විගණක